## සිරිමාවෝ බණ්ඩාරනායක විද්‍යාලය
## නාට්‍ය හා රංග කලාව - I කොටස
## 10 ශ්‍රේණිය
## I වාර පරීක්ෂණය - 2013

- **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

➢ (A) අවස්ථාවක් අනුකරණය කිරීම නාට්‍යයයි.
➢ (B) නාට්‍යය යනු ජීවිතයෙන් පෙත්තකි.
➢ (C) කාර්යයක් අනුකරණය කිරීම නාට්‍යයයි.
➢ (D) ලෝකයේ සුඛ දුක්ඛ ස්වභාවයන් අභිනයන්ගෙන් ඉදිරිපත් කිරීම නාට්‍යයයි.

(01) ඉහත ප්‍රකාශයන් අතරින් බර්නාඩ් ෂෝ මහතා නාට්‍ය පිළිබඳව ඉදිරිපත් කළ නිර්වචනය සඳහන් වන්නේ,
(i) A හිය (ii) B හිය (iii) C හිය (iv) D හිය

(02) ඇරිස්ටෝටල් පඬිවරයා නාට්‍ය පිළිබඳ සඳහන් කළ නිර්වචනය වේ.
(i) A (ii) B (iii) C (iv) D

(03) D අක්ෂරයෙන් සඳහන් නිර්වචනය ඉදිරිපත් කළ නාට්‍ය විචාරකයා විසින් රචිත ලෝප්‍රකට නාට්‍ය විචාර ග්‍රන්ථය කුමක්ද?
(i) අභිනය දර්පණය (ii) කාව්‍ය ශාස්ත්‍රය
(iii) නාට්‍ය ශාස්ත්‍රය (iv) දශරූපය

(04) A අක්ෂරයෙන් ඉදිරිපත් වන නිර්වචනය,
(i) ධනංජය පඬිවරයාගේය (ii) ඇරිස්ටෝටල් පඬිවරයාගේය
(iii) භරතමුණි පඬිවරයාගේය (iv) බර්නාඩ් ෂෝ මහතාගේය

(05) "සමාරෝපය"
(i) යම් දෙයක් ඒ අනුව පෙන්වීමයි (ii) බලවේගයන් අතර හැලහැප්පීමයි
(iii) රඟපෑන විලාසයයි (iv) තම පෞද්ගලිකත්වයෙන් බැහැරව වෙනත් චරිතයකට ආරෝපණය වීමයි

➢ (A) සංස්කරණය අත්‍යවශ්‍ය වේ.
➢ (B) සාත්වික හා ආංගික අභිනයන් ප්‍රබලව යොදා ගනියි.
➢ (C) වර්ණ, රේඛා, හැඩතල මාධ්‍ය වේ.
➢ (D) සෘජු ප්‍රේක්ෂක ප්‍රතිචාර ලබයි.
➢ (E) පුංචි තිරය ලෙස නම් ලබයි.
➢ (F) ගායනය ප්‍රධාන වේ.

(06) වේදිකා නාට්‍ය සම්බන්ධයෙන් වඩාත් අදාළ ප්‍රකාශය වන්නේ,
(i) A ය (ii) B ය (iii) C ය (iv) D ය

(07) ගීත නාට්‍ය හා ඔපෙරා යන කලා මාධ්‍යයකට අදාළ අක්ෂරය වේ.
(i) F (ii) E (iii) D (iv) C

(08) A අක්ෂරය අදාළ කලා මාධ්‍යය වන්නේ,
(i) ටෙලිනාට්‍ය හා වේදිකා නාට්‍ය ය (ii) අභිරූපණ හා සංගීත ප්‍රසංග ය
(iii) චිත්‍රපට හා ටෙලිනාට්‍ය ය (iv) නර්තනය හා චිත්‍රපට ය

(09) B අක්ෂරය වඩාත් අදාළ වන කලා මාධයය වන්නේ,
(i) චිත්‍රපට ය (ii) අභිරූපණ ය (iii) වේදිකා නාට්‍ය ය (iv) රූකඩ නාට්‍ය ය

(10) වේදිකා නාට්‍යයක ආනුෂාංගික අංගවලට අයත් නොවේ.
(i) සංගීතය (ii) රංගාභිෂේකය (iii) කැමරාකරණය (iv) අංගරචනය

- **පහත තොරතුරු ගොනුව ඇසුරින් 11-14 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

A - ප්‍රේක්ෂාව D - නාට්‍යධර්මී
B - ගැටුම E - නෘත්ත
C - නෘත්‍ය F - අභිනය

(11) ප්‍රතිවිරුද්ධ බලවේග කිහිපයක් එකිනෙක හැප්පීම නිසා මතුවන තත්වයක් නාට්‍යවල පවතියි. එම තත්ත්වය හඳුන්වන නාමය සඳහන් අක්ෂරය වන්නේ,
(i) A ය (ii) B ය (iii) C ය (iv) D ය

(12) මොහොතින් මොහොත වෙනස්වෙමින් මැවෙන දර්ශනය ලෙස හඳුන්වන්නේ,
(i) C ය (ii) E ය (iii) F ය (iv) A ය

(13) "වෙත පැමිණවීම" යන අදහස දෙන වදන වේ.
(i) A ය (ii) C ය (iii) F ය (iv) D ය

(14) "E" අක්ෂරයට අදාළ වන අංගයකි.
(i) භරත නාට්‍ය (ii) වන්නම්
(iii) ලී කෙළි (iv) ජන ලෙන්චිනා කෝළම්

(15) නාට්‍යධර්මී ශෛලියට අයත් නොවේ.
(i) මේ පෙන්වන්නේ නාට්‍යයක් බව මතක් කර දෙයි
(ii) පොතේ ගුරු, කථක, ගායක කණ්ඩායම් ඇත
(iii) නර්තනය, ගායනය බහුලය
(iv) වේදිකා පසුතල භාවිතය නාට්‍යයට වැදගත් සේ සලකයි.



(16) ඉහත ඡායාරූපයෙහි සිටින කලාකරුවා වනුයේ,
(i) පණිභාරත (ii) චිත්‍රසේන
(iii) සෝලියස් මෙන්දිස් (iv) බන්ධුල ජයවර්ධන

(17) ඔහු අයත් ප්‍රකට කලා මාධ්‍යය වන්නේ,
(i) මුද්‍රා නාට්‍ය ය (ii) චිත්‍ර කලාව ය
(iii) ඡායාරූප කලාව ය (iv) සංගීත කලාව ය

(18) "දිකිරි දිකිරි" යන නාට්‍ය ගීතය,
(i) කාරාවෝ ඉගිලෙති නාට්‍යය ය (ii) මධුර ජවනිකා නාට්‍යය ය
(iii) රත්තරන් නාට්‍යය ය (iv) රතු හැට්ටකාරී නාට්‍යය ය

(19) චුල්ල ධනුද්ධර ජාතක කතාව මූලාශ්‍ර කරගත් දේශීය නාට්‍ය කලාවේ මුදුන්මල්කඩ ලෙස හඳුන්වන නාට්‍ය නිර්මාණය වන්නේ,
(i) සිංහබාහු නාට්‍ය ය (ii) කදාවළලු නාට්‍යය ය
(iii) සඳකිඳුරු නාට්‍යය ය (iv) මනමේ නාට්‍ය ය

(20) දේශීය ළමා නාට්‍යකරණයේ පුරෝගාමී නාට්‍ය නිර්මාණකරු වන්නේ,
(i) සෝමලතා සුබසිංහ මහත්මියයි (ii) අයිරාංගනී සේරසිංහ මහත්මියයි
(iii) කෞශල්‍යා ප්‍රනාන්දු මහත්මියයි (iv) අමිතා රබ්බිඩිගල මහත්මියයි

**සිරිමාවෝ බණ්ඩාරනායක විද්‍යාලය**
**නාට්‍ය හා රංග කලාව - II කොටස**
**10 ශ්‍රේණිය**
**I වාර පරීක්ෂණය - 2013**

- **<u>පළමු ප්‍රශ්නයට අනිවාර්යයෙන්</u> පිළිතුරු සැපයිය යුතුය.**
- **තවත් තෝරාගත් ප්‍රශ්න <u>දෙකකට</u> පිළිතුරු සපයන්න.**

(01) (i) නාට්‍ය හා රංග කලාව යන්න කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 2)
(ii) වේදිකා නාට්‍ය කලාවේ සුවිශේෂී ලක්ෂණ තුනක් නම් කරන්න. (ලකුණු 3)
(iii) කතන්දරය හා නාට්‍යය අතර වෙනස්කම් පහක් සඳහන් කරන්න. (ලකුණු 5)
(ලකුණු 10)

(02) (i) දෘශ්‍ය කලා හා ප්‍රාසාංගික කලා අතර වෙනස කුමක්ද? (ලකුණු 2)
(ii) දෘශ්‍ය කලා තුනක් හා ප්‍රාසාංගික කලා තුනක් ලියන්න. (ලකුණු 3)
(iii) චිත්‍රපටය, චිත්‍රය, අභිරූපණය යන කලා මාධ්‍යවල ලක්ෂණ වෙන් වෙන් වශයෙන් ලියා දක්වන්න. (ලකුණු 5)
(ලකුණු 10)

(03) (i) නෘත, නෘත්‍ය, නාට්‍ය සංකල්ප කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 3)
(ii) සමාරෝපය සංකල්පය නාට්‍යයකදී නළුනිළියන් භාවිතා කරන ආකාරය හඳුන්වන්න. (ලකුණු 3)
(iii) "ගැටුමක් නැති තැන නාට්‍යයක් නැත" යන කියමනෙහි සත්‍යතාව කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 4)
(ලකුණු 10)

(04) (i) ක්ෂණික නිරූපණයක් යනු කුමක්ද? (ලකුණු 2)
(ii) ක්ෂණික නිරූපණවල යෙදීමේ වැදගත්කම පිළිබඳ කරුණු හතරක් ලියන්න. (ලකුණු 4)
(iii) රංග ක්‍රීඩාවල යෙදීමෙන් අත්වන වාසි හතරක් සඳහන් කරන්න. (ලකුණු 4)
(ලකුණු 10)

(05) (i) ප්‍රධාන නාට්‍ය ශෛලීන් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 2)
(ii) එම ශෛලීන් දෙකෙහි ලක්ෂණවල වෙනස්කම් තුනක් ලියන්න. (ලකුණු 3)
(iii) සතර අභිනය නම් කර එම අභිනය සතර නිදසුන් සමඟ පැහැදිලි කරන්න. (ලකුණු 5)
(ලකුණු 10)